# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 25 දරන ප්‍රවෘත්ති පත්‍ර (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 අගෝස්තු මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 අගෝස්තු මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ: ශත 35 යි　　තැපැල් ගාස්තුව: ශත 50 යි

# 1983 අංක 25 දරන ප්‍රවෘත්ති පත්‍ර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 අගෝස්තු මස 10 වන දින.]

එල්. ඩී.—ඕ. 120/78

ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1983 අංක 25 දරන ප්‍රවෘත්ති පත්‍ර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) ප්‍රවෘත්ති පත්‍ර ආඥාපනතේ 2 වන වගන්තියෙහි "ඔහු වරද කට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත් වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, එක් අවුරුද්දක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතුය." යන යෙදුම වෙනුවට, "ඔහු වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරද කරු කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාර ගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය." යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. 120 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියෙහි "එවැනි යම් අවස්ථා වක දී වරද කරන්නා වූ යම් තැනැත්තකු ඒ සම්බන්ධයෙන් වරද කරු කරනු ලැබූ විට, කරන ලද එවැනි සෑම ක්‍රියාවක් සඳහා ම, එවැනි යම් ප්‍රවෘත්ති පත්‍රයක් මුද්‍රණය කරනු ලබන හෝ ප්‍රකාශයට පත් කරනු ලබන සෑම දිනයක් සඳහා ම රුපියල් පන්සියයක් බැගින් වූ මුදලක් එවැනි සෑම තැනැත්තකුගෙන් ම රාජ්‍යසන්තක කරනු ලැබිය යුතු ය." යන යෙදුම වෙනුවට, "එවැනි යම් අවස්ථාවක දී වරද කරන්නා වූ යම් තැනැත්තකු ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, කරන ලද එවැනි සෑම ක්‍රියාවක් සම්බන්ධයෙන් ම, එවැනි යම් ප්‍රවෘත්ති පත්‍රයක් මුද්‍රණය කරනු ලබන හෝ ප්‍රකාශයට පත් කරනු ලබන සෑම දිනයක් සඳහා ම රුපියල් දෙදහස් පන්සියයක් බැගින් වූ මුදලක් එවැනි සෑම තැනැත්තකුගෙන් ම රාජ්‍යසන්තක කරනු ලැබිය යුතු ය." යන යෙදුම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—ඒ 70840—9,550 (83/06)

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියෙහි, “ යම් තැනැත්තකු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, එවැනි යම් වරදක් සහ එවැනි සෑම වරදක් සම්බන්ධයෙන් ම රුපියල් දෙසියයක් බැගින් වූ මුදලක් ඒ සෑම තැනැත්තකුගෙන් ම රාජ්‍යසන්තක කරනු ලැබිය යුතු ය.” යන යෙදුම වෙනුවට, “ යම් තැනැත්තකු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, එවැනි යම් වරදක් සහ එවැනි සෑම වරදක් සම්බන්ධයෙන් ම රුපියල් එක් දහසක් බැගින් වූ මුදලක් ඒ සෑම තැනැත්තකුගෙන් ම රාජ්‍යසන්තක කරනු ලැබිය යුතු ය.” යන යෙදුම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 5 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියෙහි (1) වන උපවගන්තියෙහි, “ තව ද, ඒ පිටපත හෝ පිටපත් එහි මින් පෙර විධාන කරන ලද ආකාරයට අත්සන් කොට භාරදීම හෝ භාරදීමට සැලැස්වීම නොසලකා හරින ඒ ප්‍රවෘත්ති පත්‍රයේ සෑම මුද්‍රණකරුවකුගෙන් ම සහ ප්‍රකාශකයකුගෙන් ම, ඒ සම්බන්ධයෙන් ඔහු වරදකරු කරනු ලැබූ විට, ඒ සෑම නොසලකා හැරීමක් සම්බන්ධයෙන් ම රුපියල් දෙසියයක් බැගින් වූ මුදලක් රාජ්‍යසන්තක කරනු ලැබිය යුතු ය.” යන යෙදුම වෙනුවට, “ තව ද ඒ පිටපත හෝ පිටපත් මෙහි මින් පෙර විධාන කරන ලද ආකාරයට අත්සන් කොට එසේ නියම කර ඇති පරිදි භාරදීම හෝ භාරදීමට සැලැස්වීම හෝ නොසලකා හරින ඒ ප්‍රවෘත්ති පත්‍රයේ සෑම මුද්‍රණකරුවකු ම සහ ප්‍රකාශකයකු ම ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, ඒ සෑම නොසලකා හැරීමක් ම සිදු කරනු ලබන පළමුවන සතියේ දී රුපියල් එක් දහසක් ද ඉන් පසුව නොසලකා හරින එක් එක් දිනය සඳහා රුපියල් දෙසියයක් බැගින් වූ අතිරේක මුදලක් ද ඒ සෑම මුද්‍රණකරුවකුගෙන් ම සහ ප්‍රකාශකයකුගෙන් ම රාජ්‍යසන්තක කරනු ලැබිය යුතු ය”. යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.